*7 වැනි පරිච්ඡේදය*

# මුදල් ප්‍රතිපත්තිය, මුදල්, ණය සහ පොලී අනුපාතික

## 7.1 සමස්ත නිරීක්ෂණ

- **උද්ධමන පීඩනය මැඩ පවත්වා අයහපත් කම්පනයන් තුළින් ඇති වූ බලපෑම අඩුකිරීමෙන් ආර්ථික වර්ධනය දිරිමත් කිරීම 2005 වසර තුළදී මුදල් ප්‍රතිපත්තියේ මූලික කාර්යභාරය විය.** අඩු උද්ධමනකාරී කාලපරිච්ඡේදය 2003 වසරේදී අවසන් වීමත් සමඟ, ලිහිල් මුදල් ප්‍රතිපත්තිය 2004 සහ 2005 වසරවලදී ක්‍රමයෙන් ඉවත් කරන ලදී. 2005 වසරේදී ලිහිල් මුදල් ප්‍රතිපත්තියෙන් සම්පූර්ණයෙන්ම ඉවත් වූයේ සාර්ව ආර්ථික කළමනාකරණයට බාධා පමුණුවමින් ඇතිවූ අභියෝග සහ අස්ථාවර තත්ත්වයන් කිහිපයකට මුහුණ දෙන අතරතුරය. තෙල් මිලෙහි වූ ඉහළ යාම, ලංකාවේ විශාලතම අපනයන කර්මාන්තයට බලපෑමක් ඇති කළ බහු කෙඳි ගිවිසුම අවසන් වීම සහ සුනාමි ව්‍යසනයට අදාළව ලබාදුන් සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු මෙම කරුණු අතර ප්‍රධාන විය. වසර ගතවීමේදී මෙම අස්ථාවර තත්ත්වයන්ගේ බලපෑම ක්‍රමයෙන් අඩු වූ අතර, ගෙවුම් තුලනය ශක්තිමත් කරමින් සහ විදේශ විනිමය ස්ථායිතාව ඇති කරමින් අඛණ්ඩව විදේශ විනිමය ලැබීම් සිදුවිය. එමගින් දේශීය ආර්ථිකය තුළ ද්‍රවශීලතාව ඉහළ ගිය අතර, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අභියෝගාත්මක කාර්යයක් විය.

- **2005 වර්ෂය තුළ මුදල් සහ ණය සමස්තයන්හි ඉහළ වර්ධනය සහ අයහපත් උද්ධමන අපේක්ෂාවන් පැවතීම විද්‍යමාන වීමත් සමඟම එම තත්ත්වයන් මැඩ පැවැත්වීම අරමුණු කරගෙන මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කෙරිණ.** මුදල් සහ ණය සමස්තයන් ඉහළ අනුපාතිකයකින් වර්ධනය වීම ඉහළ උද්ධමන අපේක්ෂාවන් ඇතිවීමට හේතු වූ අතර, එය විශේෂයෙන් රජයේ සුරැකුම්පත් සඳහා වූ ඵලදා අනුපාතික ඇතුළු වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ යාමේ ප්‍රවනතාවය තුළින් පැහැදිලි විය. මුදල් සමස්තයන්හි ඉහළ වර්ධනය පාලනය කිරීමට සහ උද්ධමනාත්මක අපේක්ෂාවන් අඩු කිරීමට හැකිවන පරිදි මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමයෙන් අවස්ථා හතරකදී පදනම් අංක 125 කින් ඉහළ දැමීමත්, විවට වෙළෙඳ කටයුතු එක් දින පදනමක් මත සහ ස්ථිර පදනමක් මත වඩාත් දැඩි ලෙස සිදු කිරීම මගින් අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමත් සිදු විය.

- **මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්ට ආර්ථිකය මනා ප්‍රතිචාර දක්වූ අතර. එය මුදල් සැපයුමෙහි වර්ධනය පහළ යෑම. උද්ධමන හා උද්ධමන අපේක්ෂාවන් අඩු වීම සහ වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ යාම තුළින් විද්‍යමාන විය.** 2005 දෙසැම්බර් මාසය අගවනවිට සංචිත මුදල් ඉලක්කගත වර්ධන මට්ටම දක්වා පහත වැටුණු අතර, පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය ද පහත වැටුණි. විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඉදිරි විනිමය සඳහා වූ අධි මිල අඩුවීමෙන් සහ වසර අග භාගය වනවිට රජයේ සුරැකුම්පත් සඳහා වූ ද්විතීයික වෙළෙඳපොළ පොලී අනුපාතික ස්ථායී වීම තුළින් උද්ධමන අපේක්ෂාවල අඩුවීමක් පෙන්නුම් කළේය. මෙම වර්ධනාත්මක තත්ත්ව උද්ධමන වේගය පහත හෙළීමට හේතු වූ අතර, සැපයුම් අංශයේ පැවති යහපත් වර්ධනයන් ද ඒ සඳහා උපකාරී විය.

## 7.2 මුදල් ප්‍රතිපත්තිය

- **මුදල් සමස්තයන් ඉලක්ක කරගත් රාමුවක් තුළ සහ නිදහසේ පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළේය.** සංචිත මුදල් (අධි බලැති මුදල්) සහ පුළුල් මුදල් ($M_{2b}$) පිළිවෙළින් මුදල් ප්‍රතිපත්තියේ මෙහෙයුම් ඉලක්කය සහ අතරමැදි ඉලක්කය ලෙස අඛණ්ඩව පවත්වා ගැනිණ. මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් පොලී අනුපාතිකවලින් සමන්විත පොලී අනුපාතික පරාසය තුළ සක්‍රීය විවට වෙළෙඳ කටයුතු යොදා ගනිමින් සංචිත මුදල්හි පෙර තීරණය කරගත් මට්ටමක් ළඟාකර ගැනීම සඳහා මුදල් මෙහෙයුම් කටයුතු සිදු කෙරුණි. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය සියයට 10 ක් ලෙස ද මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට අත්තිකාරම් සපයන පොලී අනුපාතිකය වන බැංකු අනුපාතිකය සියයට 15 ක් ලෙස ද නොවෙනස්ව පවත්වා ගන්නා ලදී.

- **මුදල් සහ ණය සමස්තයන්හි වේගවත් වර්ධනය සහ ඉහළ යමින් පැවති උද්ධමනාත්මක පීඩනය අඩු කිරීම අරමුණු කරමින් 2005 වර්ෂය තුළ මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම සිදු විය.** මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික වන ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් පොලී අනුපාතික 2005 වර්ෂය තුළ අවස්ථා හතරකදී පදනම් අංක 125 කින් ඉහළ දමන ලදී. එනම්, මැයි මසදී පදනම් අංක 25, ජූනි මසදී පදනම් අංක 50, සැප්තැම්බර් මසදී පදනම් අංක 25 සහ දෙසැම්බර් මසදී පදනම් අංක 25 වශයෙනි. එමෙන්ම, අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීම සඳහා විවට වෙළෙඳපොළ කටයුතු දැඩි ලෙස පවත්වා ගැනිණ. රජයේ විදේශ විනිමය ලැබීම් මහ බැංකුව විසින් මිලදී ගැනීම හේතුවෙන් ඉහළ ගිය ද්‍රවශීලතාවය අවශෝෂණය කරගැනීම සඳහා මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනමක් මත අලෙවි

කිරීම ද දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග සඳහා තවදුරටත් අනුබලයක් විය. කෙසේ වුවද, සුනාමි ව්‍යසනයෙන් පසු වෙළෙඳපොළ තුළ ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වා ගැනීම තහවුරු කරනු පිණිස 2005 ජනවාරි මස මුල සිට බල පැවැත්වෙන පරිදි විවට වෙළෙඳ කටයුතු යටතේ දිනපතා වෙන්දේසි මගින් අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කිරීම තාවකාලිකව අත්හිටුවන ලදී. මූල්‍ය අංශයට සහ ආර්ථික කටයුතුවලට සුනාමි ව්‍යසනයෙන් ඇතිවූ තර්ජනය ක්‍රමයෙන් පහව යාම ඇරඹීමත් සමඟ විවට වෙළෙඳපොළ කටයුතු 2005 පෙබරවාරි මස අගදී නැවත ඇරඹුණි.

- **මුදල් ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග, මුදල් සහ ණය සමස්තයන්හි ඉහළ වර්ධනය අඩු කිරීමටත්, උද්ධමනකාරී පීඩනය අඩු කිරීමටත් උපකාරී විය.** මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික පිළිවෙළින් සියයට 8.75 සහ සියයට 10.25 දක්වා සංශෝධනය වීමත් සමඟ අරමුදල් පිරිවැය ඉහළ නංවමින් පොලී අනුපාතික ව්‍යුහය ඉහළ මට්ටමක් දක්වා වෙනස් විය. මහ බැංකුව විසින් දෛනිකව පවත්වනු ලබන වෙන්දේසිවල බරිත සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් පොලී අනුපාතිකය (සඵල ප්‍රතිපත්ති පොලී අනුපාතිකය) 2005 වසර තුළදී පදනම් අංක 145 කින් ඉහළ නැගුණි. ඒක්ෂණ වෙළෙඳපොළ පොලී අනුපාතික පදනම් අංක 125 කින් ඉහළ ගිය අතර, බරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතිකය (AWDR) සහ බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) පිළිවෙළින් පදනම් අංක 93 කින් සහ 201 කින් ඉහළ නැගුණි. සංචිත මුදල් 2004 වර්ෂය තුළ ඉහළ අනුපාතිකයකින් වර්ධනය වූ අතර, 2005 වර්ෂය තුළ ක්‍රමයෙන් අඩු වේගයකින් වර්ධනය වෙමින් වසර අගදී සියයට 15.8 ක් විය. එය ඉලක්කගත වර්ධන අනුපාතිකය වූ සියයට 15 ට වඩා මඳක් ඉහළ අගයක් විය. මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරිමට ධනාත්මක ලෙස ප්‍රතිචාර දක්වමින් පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය ද වසර අගවන විට ක්‍රමයෙන් අඩු විය. කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි ලක්ෂ්‍යමය පදනම මත මනිනු ලැබූ උද්ධමනය පෙබරවාරි මසදී සියයට 15.9 ක් වූ ඉහළ මට්ටමක පැවති අතර, මුදල් සමස්තයන්හි සංකෝචනය සහ සැපයුම් තත්ත්වයන්ගේ වර්ධනය හේතුවෙන් ක්‍රමයෙන් අඩු වී 2005 දෙසැම්බර් මාසයේදී සියයට 8 ක් විය. ශ්‍රී ලංකා පාරිභෝගික මිල දර්ශකයෙහි ලක්ෂ්‍යමය පදනම මත මනිනු ලබන උද්ධමනය 2004 අගදී සියයට 16.8 සිට 2005 අගදී සියයට 3.6 දක්වා කොළඹ පාරිභෝගික මිල දර්ශකයට වඩා වැඩි වේගයකින් පහත වැටුණි.

- **මුදල් ප්‍රතිපත්තියෙහි සඵලදායි බව වර්ධනය කිරීම සඳහා ප්‍රධාන අවශ්‍යතාවයක් වන ප්‍රතිපත්ති ක්‍රියා මාර්ගවල විනිවිදභාවය සහ ඒවා සන්නිවේදනය කිරීම කෙරෙහි මහ බැංකුව අඛණ්ඩව වැඩි අවධානයක් යොමු කළේය.** ඒ අනුව, වර්ෂය මුලදී මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති ඉලක්ක සහ ඒ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මහජනයා වෙත දැනුම් දෙනු ලැබීය. මාසික මුදල් ප්‍රතිපත්ති විවරණයන්හිදී ගත් තීරණ සහ ඒ සඳහා සලකා බලන ලද සාධක පුවත්පත් නිවේදන මගින් මහජනයා වෙත දැනුම් දීම පූර්ව දින දර්ශනයකට අනුව ක්‍රමවත්ව සිදු විය. එමෙන්ම, වෙළෙඳපොළ සහභාගිවන්නන් හට සහ මහජනතාවට වඩාත් යෝග්‍ය තීරණ ගැනීමට හැකිවන සේ ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන්හි වර්ධනය සම්බන්ධයෙන් වූ තොරතුරු මහ බැංකුව මාධ්‍යයන් තුළින් සහ සිය වෙබ් අඩවිය තුළින් අඛණ්ඩව ලබා දුන්නේය.


- **මූල්‍ය පද්ධතිය තුළ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම තුළින් මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය ශක්තිමත් කිරීම සඳහා ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබිය.** ගෙවීම් ක්‍රමයෙහි ආරක්ෂිත බව සහ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහාත් මූල්‍ය වෙළෙඳපොළවල සුමට ක්‍රියාකාරීත්වයක් ඇති කිරීම සඳහාත් ගෙවීම් සහ පියවීම් පද්ධති පනත ගෙන එනු ලැබීය. මූල්‍ය ආයතනවල අවදානම් කළමනාකරණය, ඔරොත්තුදීමේ ශක්තිය, තරගකාරීත්වය සහ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා නියාමන ක්‍රියාමාර්ග ගණනාවක් ද ගෙන ඇත. කල්බදු සමාගම්වලට සිය කල්බදු හා සම්බන්ධ වත්කම් සුරැකුම්කරණයට ඉඩ සලසමින් මූල්‍ය කල්බදු පනතට සංශෝධනයන් ගෙන ඒමත්, රජයේ සුරැකුම්පත් වෙළෙඳම සහ පියවීම් යාන්ත්‍රණය පුළුල් කිරීමත් දිගුකාලීන ණය සුරැකුම් වෙළෙඳපොළ වර්ධනය කිරීමට උපකාරි වනු ඇත.

## 7.3 මුදල් සහ ණය සමස්තයන්ගේ වර්ධනයන්

### මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය

- **වෙළෙඳපොළ අතිරික්ත ද්‍රවශීලතාවය ඉහළ මට්ටමක පැවතීම මූල්‍ය ප්‍රසාරණය වේගවත් කිරීමට සහ අනාගත උද්ධමනාත්මක පීඩනය වැඩි කිරීමට හේතු විය හැකි බැවින් ආර්ථිකයේ ඉල්ලුම් පීඩනය පාලනය කරන අතරම, පවත්නා ආර්ථික සංවර්ධන කටයුතු දිරිමත් කිරීමට හැකිවන පරිදි 2005 වසර මුළුල්ලේම වෙළෙඳපොළ ද්‍රවශීලතාවය යෝග්‍ය මට්ටමක පවත්වා ගන්නා ලදී.** කෙසේ වෙතත්, සුනාමි ව්‍යසනය ඇති වූ විගසම, මහ බැංකුව විසින් මුදල් සහ මූල්‍ය වෙළෙඳපොළ කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමට පහසුකම් සැලසීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් සැපයීමට හැකිවන ලෙස සහන රැසක් ලබාදීමට කටයුතු කරන ලදී. විවට වෙළෙඳපොළ කටයුතු මගින් අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කිරීම 2005 ජනවාරි මස 5 වැනි දින සිට 2005 පෙබරවාරි මස 21 දින වන තුරු තාවකාලිකව නවත්වන ලදී. සුනාමි ආධාර හා සම්බන්ධ මූල්‍ය ලැබීම් ඉහළයාම නිසා ආර්ථිකයේ ද්‍රවශීලතා මට්ටම ඉහළ ගිය බැවින් අතිරික්ත ද්‍රවශීලතාවය සම්පූර්ණයෙන්ම පාහේ අවශෝෂණය කිරීම සඳහා විවට වෙළෙඳපොළ කටයුතු වඩාත් දැඩි ලෙස එක් දින පදනමකින් සහ ස්ථිර පදනමකින් යුතුව සිදුකරන ලදී.

**7.1 රූප සටහන**
**සංචිත මුදල් වර්ධනය සහ ප්‍රභවයන්**




### සංචිත මුදල්

- **2005 වර්ෂයේ මාර්තු මාසයෙන් අවසන් වූ කාර්තුව හැරුණු විට අනෙකුත් කාර්තු සඳහා වූ සංචිත මුදල් ඉලක්කයන් සපුරා ගැනීමට හැකි විය.** සුනාමි සහන ක්‍රියාකාරකම් හේතුවෙන් ව්‍යවහාර මුදල් සඳහා පැවති අධික ඉල්ලුමෙහි ප්‍රතිඵලයක් ලෙස මාර්තු මාසය අවසානය වනවිට සංචිත මුදල් ඉලක්කගත මට්ටමට වඩා වැඩි වේගයකින් වර්ධනය විය. 2004 දෙසැම්බර් මාසයේදී සියයට 20.9 ක් වූ සංචිත මුදල් වර්ධන අනුපාතිකය හා සැසඳීමේදී 2005 දෙසැම්බර් මාසය සඳහා අපේක්ෂිත ඉලක්කය වූ සියයට 15 ආන්තික ලෙස ඉක්මවා යමින් සංචිත මුදල් සියයට 15.8 කින් වර්ධනය විය.

- **2005 වසරේ සංචිත මුදල් ප්‍රසාරණය සම්පූර්ණයෙන්ම මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම්වල වැඩිවීම තුළින් පිළිබිඹු විය.** මහ බැංකුව විසින් රජය ලද විදේශ විනිමය ලැබීම් මිලදී ගැනීම හේතුවෙන් මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් වැඩි විය. සුනාමි ව්‍යසනය හා සම්බන්ධ ලැබීම්, රජයට අන්තර් ජාතික ආධාර සපයන ආයතනවලින් ණය සහ ප්‍රදාන වශයෙන් වූ ලැබීම් සහ රජය දේශීය බැංකුවල විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකවලින් ලබාගත් විදේශ ව්‍යවහාර මුදල් ණය මෙම විදේශ විනිමය ලැබීම්වලට ඇතුළත් විය.

- **ශුද්ධ විදේශීය වත්කම් ඉහළයාමෙන් ඇති වූ බලපෑම සමනය කර, සංචිත මුදල්වල වර්ධනය පාලනය කිරීම සඳහා විවට වෙළෙඳ කටයුතු යොද ගැනීම හේතුවෙන් මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් පහත වැටිණි.** ශුද්ධ දේශීය වත්කම් රුපියල් බිලියන 18 කින් පහත වැටීම 2005 වසරේ සංචිත මුදල් වර්ධනය රුපියල් බිලියන 26 කට සීමා කිරීමට උපකාරී විය. ශුද්ධ විදේශීය වත්කම් වැඩිවීම තුළින් වැඩි වූ අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් දරීම් 2004 වසර අගදී රුපියල් බිලියන 74 සිට 2005 වසර අගදී රුපියල් බිලියන 35.6 දක්වා පහත වැටිණ. කෙසේ වෙතත්, 2005 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට

**7.1 සංඛ්‍යා සටහන**
**මුදල් සමස්තයන්හි වර්ධනයන්**

රුපියල් බිලියන

| ශීර්ෂය | 2004 අවසානයට | 2005 අවසානයට | වෙනස 2004 ප්‍රමාණය | වෙනස 2004 % | වෙනස 2005 ප්‍රමාණය | වෙනස 2005 % |
|---|---|---|---|---|---|---|
| 1. සමස්ත ව්‍යවහාර මුදල් එකතුව | 115.9 | 132.4 | 17.1 | 17.3 | 16.5 | 14.3 |
| 1.1 මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | 99.7 | 114.1 | 14.1 | 16.4 | 14.4 | 14.4 |
| 1.2 වාණිජ බැංකු වෙතැති ව්‍යවහාර මුදල් | 16.2 | 18.3 | 3.0 | 22.7 | 2.1 | 13.0 |
| 2. මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු | 55.1 | 65.5 | 12.5 | 29.3 | 10.4 | 18.9 |
| 3. මහ බැංකුව වෙතැති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු | ... | ... | ... | ... | ... | ... |
| **4. සංචිත මුදල් (1+2+3)** | **171.0** | **197.9** | **29.6** | **20.9** | **26.9** | **15.8** |
| 5. වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | 88.8 | 116.6 | 12.8 | 16.8 | 27.8 | 31.4 |
| **6. පටු මුදල් සැපයුම $M_1$ (1.1+5)** | **188.5** | **230.7** | **26.9** | **16.6** | **42.2** | **22.4** |
| 7. වාණිජ බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු | 499.5 | 592.2 | 80.4 | 19.2 | 92.7 | 18.6 |
| **8. පුළුල් මුදල් සැපයුම $M_2$ (6+7)** | **688.0** | **822.9** | **107.3** | **18.5** | **134.9** | 19.6 |
| 9. විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු (අ) | 170.7 | 199.4 | 33.6 | 24.5 | 28.7 | 16.8 |
| **10. ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම $M_{2b}$ (8+9)** | **858.6** | **1,022.3** | **140.9** | **19.6** | **163.6** | **19.1** |
| **මුදල් ගුණකය $M_{2b}$** | **5.02** | **5.16** | | | | |
| **සංසරණ ප්‍රවේගය $M_{2b}$** (ආ) | **2.61** | **2.53** | | | | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි නේවාසික තැන්පතු සහ දේශීය බැංකු ඒකකවල විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවලින් කොටසක් ඇතුළත් වේ.
(ආ) වර්ෂය තුළ

**විශේෂ සටහන 14**

## ඉහළ වටිනාකමින් යුත් මුදල් නෝට්ටුවල අවශ්‍යතාවය

වසර 1950 දී ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවන ලද අවස්ථාවේ දී එයට පෙර පැවති ව්‍යවහාර මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද රුපියල් 1, 2, 5, 10, 50, 100, 500, සහ 1,000, නෝට්ටුද, ශත 1, 2, 5, 10, 25, 50 සහ රුපියලේ කාසිද ව්‍යවහාරයේ පැවතිණ. 1951/52 වසරවල දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රු.1, 2, 5, 10, 50 සහ 100 වටිනාකමින් යුත් නෝට්ටු මුද්‍රණය කිරීම ආරම්භ කරන ලද අතර, 1979 දී රු.20 වටිනාකමින් යුත් නෝට්ටුව හඳුන්වා දෙන ලදී. 1981 දී ශ්‍රී ලංකා මහ බැංකුව රු.500 හා රු.1,000 වටිනාකමින් යුත් නෝට්ටු නිකුත්කළ අතර, ඉන්පසු වැඩි වටිනාකම්වලින් යුත් නෝට්ටු නිකුතුවක් මේ දක්වා සිදු කර නැත[1].

ව්‍යවහාරයේ පවත්නා කාසි හා නෝට්ටුවලට අමතරව ගෙවීම් සහ පියවීම් කටයුතු සඳහා විවිධාකාර ගෙවීම් උපකරණ නූතන ආර්ථිකයන්හි දක්නට ලැබේ. චෙක්පත්, ණය කාඩ්පත්, හර කාඩ්පත් සහ විද්‍යුත් ගෙවීම් මාධ්‍යයන් ඒ අතර ප්‍රධාන ස්ථානයක් ගනී. නූතන ආර්ථිකයන්හි කාසි හා නෝට්ටු භාවිතය සාපේක්ෂ වශයෙන් අඩුවෙමින් පැවතුණ ද, ලොවපුරා තවමත් එය වඩාත් ප්‍රචලිත ගෙවීම් මාධ්‍යය ලෙස භාවිතාවේ. ගනුදෙනු පරිමාව ඉහළයාම හා මිල ඉහළ යාම ව්‍යවහාර මුදල් ඉල්ලුම ඉහළයාමට බලපාන සාධක වේ. ගනුදෙනු ප්‍රමාණය ඉහළ යන විට, ඉහළ වටිනාකමින් යුතු ගනුදෙනු සපුරාලීම සඳහා මහජනතාව විශේෂයෙන් ඉහළ වටිනාකමින් යුත් නෝට්ටු වැනි පහසු ගෙවීම් මාධ්‍ය අපේක්ෂා කරති. 1981 වසරේ රු.1,000 වටිනාකමින් යුත් නෝට්ටු ප්‍රථමයෙන් නිකුත් කරන අවස්ථාවේ දී ඒක පුද්ගල ව්‍යවහාර මුදල් ඉල්ලුම රු.380 දක්වා වැඩි වී තිබූ අතර, එය 1952 වසරේ දී රු.49 ක් විය. එමෙන්ම, ගනුදෙනු ප්‍රමාණය ඉහළයාමත් සමග 2005 වසර වන විට සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් වල වටිනාකමින් රුපියල් 1,000 නෝට්ටුවල ප්‍රතිශතය සියයට 77 දක්වා වැඩි වී ඇත. රූපසටහන වි.ස. 14.1 මගින් ඉහළම වටිනාකමින් යුතු ව්‍යවහාර මුදල් ඒකක සඳහා පැවති ඉල්ලුම නිරූපණය වේ. ඉහළම වටිනාකමින් යුතු සංසරණයේ පවතින මුදල් නෝට්ටුව අනුව ව්‍යවහාර මුදල් ප්‍රමාණය 1952 දී නෝට්ටු දශ ලක්ෂ 3.9 සිට 1981 දී නෝට්ටු දශ ලක්ෂ 56.4 දක්වා ඉහළ ගියේය. රු. 1,000 නෝට්ටුව හඳුන්වාදීමත් සමග ඉහළ වටිනාකමින් යුත් මුදල් නෝට්ටු සංසරණය නෝට්ටු දශ ලක්ෂ 5.6 දක්වා පහත වැටිණ. 2005 වන විට එය නෝට්ටු දශ ලක්ෂ 132.4 දක්වා ඉහළ ගොස් ඇති අතර, ඉන් පැහැදිලි වන්නේ ඉහළ වටිනාකමින් යුත් මුදල් නෝට්ටු සඳහා ඇති ඉල්ලුම වැඩිවී ඇති බවයි. 1981 සිට ඉල්ලුම වැඩි වුවද, එය සපුරාලීම සඳහා ඉහළ වටිනාකමින් යුත් ව්‍යවහාර මුදල් නිකුත් නොවීය.

ඉහළ වටිනාකමින් යුත් ව්‍යවහාර මුදල් නෝට්ටු හඳුන්වාදීමේ වාසි හා අවාසි කිහිපයක් ඇත.

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවලින් කරන ගෙවීම් සඳහා බොහෝවිට ඉහළ අගයකින් යුත් නෝට්ටු අවශ්‍ය වන අතර ඒවා එම යන්ත්‍රවල ගබඩා කර තබනුයේ කුඩා අගයන්ගෙන් යුත් නෝට්ටු විශාල

**සංඛ්‍යා සටහන වි. ස. 14.1**

**ව්‍යවහාර මුදල් සඳහා වන ඉල්ලුමේ වෙනස්වීම්**

| නව මුදල් නිකුත්කළ වර්ෂය | නව මුදල් නෝට්ටුවල වටිනාකම | ජනගහණය (දශ ලක්ෂ) | සංසරණයේ ඇති මුළු මුදල් ප්‍රමාණය (රුපියල් දශ ලක්ෂ) | ඒක පුද්ගල ව්‍යවහාර මුදල් ප්‍රමාණය (රුපියල්) | නොපියවා ඇති සංසරණයේ ඇති මුදල්වල වටිනාකම/ඉහළම අගයෙන් යුතු නෝට්ටුවේ වටිනාකම (නෝට්ටු සංඛ්‍යාව දශ ලක්ෂවලින්) |
|---|---|---|---|---|---|
| 1952 | රු. 1,2,5,10,50,100 | 7.9 | 389 | 49 | 3.9 |
| 1981 | රු.500, රු.1,000 | 14.8 | 5,644 | 380 | 56.4 |
| 2005 | | 19.6 | 132,436 | 6,757 | 132.4 |

මූලයා: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන වි.ස. 14.1**

**ඉහළම වටිනාකමින් යුත් මුදල් නෝට්ටු අනුව ව්‍යවහාර මුදල් ඒකක සංඛ්‍යාව**




[1] 1998 දී සමරු නෝට්ටුවක් ලෙස රුපියල් 200 නෝට්ටුව නිකුත් කරන ලදී.

ප්‍රමාණයක් ගබඩා කර තැබීම ආර්ථික වශයෙන් අවාසිදයක වීම නිසාය. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හඳුන්වාදීමත් සමඟ, අඩු වටිනාකමින් යුත් නෝට්ටු භාවිතයේ මෙහෙයුම් පිරිවැය අධික බැවින් ඉහළ වටිනාකමින් යුත් නෝට්ටු සඳහා ඇති ඉල්ලුම ඉහළ ගියේය. මුදල් නොවන ගෙවීම් පහසුකම් දුරස්ථ ප්‍රදේශවල නොමැතිකම නිසා එම ප්‍රදේශවල ඉහළ අගයෙන් යුත් නෝට්ටුවල අවශ්‍යතාවය වැඩිවී ඇත. උදහරණයක් ලෙස, ග්‍රාමීය හා දුරස්ථ ප්‍රදේශවලදී වැඩි වටිනාකමකින් යුත් ගනුදෙනු කිරීමට බලාපොරොත්තුවන සංචාරකයන් හට ඉහළ අගයක් සහිත නෝට්ටු භාවිතයෙන් වඩා පහසුවෙන් එම ගනුදෙනු නිම කරගත හැකිවේ.

මුදල් නෝට්ටු වටිනාකම ඉහළ වුවද, මුද්‍රණ පිරිවැය විශාල වශයෙන් වෙනස් නොවන හෙයින් ඉහළ වටිනාකමින් යුතු නෝට්ටු මුද්‍රණය පිරිවැය අතින් ඵලදයී වේ. පිරිවැය ඉතිරියක් සිදුවන්නේ අඩු වටිනාකමින් යුත් නෝට්ටු මුද්‍රණය කෙරෙන ප්‍රමාණය පහළයාම නිසා පමණක් නොව, අඩු සංසරණයකින් යුක්තවන හෙයින් ඉහළ වටිනාකමින් යුතු නෝට්ටු වැඩි ආයු කාලයකින් ද සමන්විත හෙයිනි. සාමාන්‍යයෙන් රුපියල් 1,000 සහ රුපියල් 500 හා නෝට්ටුවල බරිත සාමාන්‍ය ජීවිත කාලය වසර 6 - 7 දක්වා වන නමුත්, රුපියල් 10 වැනි අඩු වටිනාකම සහිත නෝට්ටුවක ආයු කාලය වසරකටත් අඩුය. එමෙන්ම, ඉහළ වටිනාකමින් යුත් ගනුදෙනුවල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ඉහළ අගයන්ගෙන් යුත් මුදල් නෝට්ටු යොද ගැනීම ප්‍රයෝජනවත් වන අතරම, එය කාලය ඉතිරි කිරීමට ද හේතු වේ.

ඉහළ වටිනාකමින් යුතු නෝට්ටුවල ප්‍රධානම දුර්වලතාවය වනුයේ ව්‍යාජ නෝට්ටු මුද්‍රණය පිළිබඳව ඇති අවදනමයි. මුදල් විශුද්ධිකරණය (Money Laundering) හා නීත්‍යානුකූල නොවන ආර්ථික කටයුතුවල යෙදෙන්නන්ට ඉහළ අගයක් සහිත නෝට්ටු යොදගැනීම හේතුවෙන් එවැනි කටයුතුවල වැඩි පහසුවක් සැලසීම ද අවාසියකි. කෙසේ වුවද මෙම දුර්වලතා පූර්වෝපාය ක්‍රියාමාර්ග ගැනීම තුළින් සාර්ථකව මගහරවා ගතහැකිය. ඉහළ වටිනාකමක් සහිත නෝට්ටු උසස් ආරක්ෂක උපක්‍රම සහිතව මුද්‍රණය කිරීමෙන් හා එවැනි නෝට්ටු ගනුදෙනු සඳහා භාරගන්නා පුද්ගලයින් විචක්ෂණශීලීව හා අවධානයෙන් යුතුව එම නෝට්ටු භාරගැනීමෙන් මෙම අවදනම අවම කරගත හැක. මේ සඳහා ඵලදයී මහජන දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. මුද්‍රණ පිරිවැය පහළ වැටීම සිදුවන බැවින් ඉහළ වටිනාකමින් යුත් නෝට්ටු සඳහා ආරක්ෂක උපක්‍රම වැඩි වශයෙන් ඇතුළු කිරීම සඳහා දැරිය යුතු වන පිරිවැය නොසැලකිය යුතු තරම් වේ.

සපයන ලද තාවකාලික අත්තිකාරම් රුපියල් බිලියන 5 කින් ඉහළ නැගුණි.[1] භාණ්ඩාගාර බිල්පත් දැරීම් අඩුවීමට අමතරව, 2005 වසර තුළදී රුපියල අධි ප්‍රමාණය වීම නිසා ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම් රුපියල් බිලියන 15 කින් පමණ ඉහළ යාම ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් පහත වැටීමට හේතු විය.


- **සංචිත මුදල් භාවිතය පිළිබඳව සලකා බැලීමේදී, එහි ප්‍රසාරණය, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ඉහළයාම සහ වාණිජ බැංකු තැන්පතුවල ඉහළයාම තුළින් පිළිබිඹු විය.** මහ බැංකුවේ ඇති වාණිජ බැංකු තැන්පතු රුපියල් බිලියන 10.5 කින් ඉහළ ගිය අතර, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් රුපියල් බිලියන 16.5 කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, පොලී අනුපාතික ඉහළ යාමත් සමඟ මහජනතාවගේ වැඩි වරණය පොලී සහිත වත්කම් වෙත නැඹුරුවීම පෙන්නුම් කරමින් ව්‍යවහාර මුදල්වල වර්ධනය පහත වැටුණි.

## පටු මුදල් සැපයුම ($M_1$)

- **මහජනතාව සතු ව්‍යවහාර මුදල් සහ ඉල්ලුම් තැන්පතු වලින් සමන්විත පටු මුදල් සැපයුම 2004 වසරේ පැවති සියයට 16.6 ක වර්ධනය හා සැසඳීමේදී 2005 වසරේදී සියයට 22.4 කින් වර්ධනය විය.** මහජනතාව අතැති ව්‍යවහාර මුදල් සියයට 14.4 කින් (රුපියල් බිලියන 14.4 කින්) වර්ධනය වූ අතර, මහජනතාව සතු ඉල්ලුම් තැන්පතු සියයට 31.4 කින් (රුපියල් බිලියන 27.8 කින්) වර්ධනය විය.

**7.2 රූප සටහන**

**ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$) වර්ධනය සහ එහි ප්‍රභවයන්**




## පුළුල් මුදල් සැපයුම ($M_{2b}$)

- **2004 වසරේදී ඉහළ මට්ටමක පැවති පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය 2005 වසරේ බොහොමයක්**

[1] අයවැයෙහි වාර්ෂික ඇස්තමේන්තුගත ආදයමින් සියයට 10 කට සමාන තාවකාලික අත්තිකාරම් මහ බැංකුවෙන් ලබා ගැනීමට රජයට හැකියාව ඇත.

**මාසවලදද අඛණ්ඩව ප්‍රසාරණය වූ තමුදු දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස 2005 දෙසැම්බර් මස වන විට අඩු වර්ධනයක් පෙන්විය**. 2005 වසරේ බොහොමයක් මාස වලදී පුළුල් මුදල් සැපයුම සියයට 20-21 අතර පරාසයකින් යුතුව අඛණ්ඩව වර්ධනය වූ අතර, 2005 දෙසැම්බර් මාසයේදී එය සියයට 19 ක දක්වා අඩු විය. පුළුල් මුදල් සැපයුමෙහි ප්‍රසාරණය පෞද්ගලික අංශයට සහ රාජ්‍ය අංශයට සපයන ලද ණය ඉහළයාම තුළින් ප්‍රධාන වශයෙන් පිළිබිඹු විය.

- **පුළුල් මුදල් සැපයුමේ සියලුම සංරචක එනම් ව්‍යවහාර මුදල්. ඉල්ලුම් තැන්පතු සහ කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතුවල වර්ධනය 2005 වසරේදී ඉහළ ගියේය**. ආර්ථික කටයුතු වර්ධනය වීමත් සමඟ ගනුදෙනු සඳහා ඇති ඉල්ලුම වැඩිවීම පිළිබිඹු කරමින් 2004 වසරේදී සියයට 16.4 කින් ඉහළ ගිය මහජනතාව සතු ව්‍යවහාර මුදල් 2005 වසරේදී සියයට 14.4 කින් ඉහළ ගියේය. ක්‍රමිකව ඉහළ යන ලද පොලී අනුපාතික සහ බැංකු මගින් තැන්පතුකරුවන් ආකර්ෂණය කර ගැනීම පිණිස ක්‍රියාත්මක කරන ලද ආකර්ෂණීය තැන්පතු යෝජනා ක්‍රමවලට ප්‍රතිචාර දක්වමින් ඉතිරි කිරීමේ තැන්පතු සියයට 13 කින් ද, කාලීන තැන්පතු සියයට 23.6 කින් ද වර්ධනය විය. විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ද සියයට 17 කින් ඉහළ ගිය අතර, මෙය ප්‍රධාන අන්තර්ජාතික වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ යාමට සමගාමීව, බැංකු මගින් ලබාදුන් ආකර්ෂණීය පොලී අනුපාතික හේතුවෙන් සිදුවන්නට ඇත.

**පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වර්ධනයට තුඩු දුන් සාධක:**

- **බැංකු ක්‍රමයෙහි ශුද්ධ දේශීය වත්කම් සහ ශුද්ධ විදේශීය වත්කම් යන දෙකෙහිම වර්ධනය 2005 වසරේ පුළුල් මුදල් සැපයුමේ වර්ධනයට හේතු විය**. දේශීය ණය වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස වැඩි වූ ශුද්ධ දේශීය වත්කම් මුදල් සැපයුමේ වර්ධනයට සියයට 79 කින් දායක විය.

- **ශුද්ධ දේශීය වත්කම්වල ප්‍රසාරණය සඳහා බලපෑ ප්‍රධානතම සාධක වූයේ රාජ්‍ය අංශයට සහ පෞද්ගලික අංශයට සපයන ලද ණය ඉහළ යාමයි**. කෙසේ වුවද, පෞද්ගලික අංශයට දෙන ලද ණය සියයට 21.5 කින් වර්ධනය වෙමින් පුළුල් මුදල් සැපයුමේ වර්ධනයට සියයට 84 කින් දායක විය. සියයට 11.9 කින් වර්ධනය වූ රජයේ ශුද්ධ ණය ගැනීම් පුළුල් මුදල් සැපයුමේ වර්ධනයට සියයට 16 කින් දායක විය. රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය ප්‍රමාණය සියයට 59.5 කින් අඩුවීම සහ ප්‍රාග්ධන අරමුදල්වල ප්‍රසාරණය සමඟ බැංකු පද්ධතිය තුළ පවත්නා අනෙකුත් වගකීම්වල වැඩිවීම පුළුල් මුදල් සැපයුමේ ඉහළ වර්ධනය තරමක් අඩු කිරීමට හේතු විය.

- **ආර්ථික කටයුතු වේගයෙන් යථා තත්ත්වයට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශයට සපයන ලද ණය වර්ධනය විය**. මූර්ත පොලී අනුපාතික අඩු මට්ටමක පැවතීම සහ බැංකු විසින් විශේෂයෙන් පරිභෝජන ණය යෝජනා ක්‍රම ඇතුළත් වඩාත් ආකර්ෂණීය ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම ද මේ සඳහා හේතු විය. ණය ප්‍රසාරණයෙන් සියයට 91 කට දායක වූයේ දේශීය බැංකු ඒකක වන අතර, විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක ඉතිරි සියයට 9 ට දායක විය. ණය ප්‍රසාරණයෙන් වැඩි කොටසක් එනම් සියයට 21ක් අවශෝෂණය කරගනු ලැබුවේ දේශීය හා විදේශීය වෙළෙඳ කටයුතුවලින් සමන්විත වාණිජ අංශයයි. මෙයට අමතරව, ප්‍රධාන වශයෙන් පරිභෝජන සහ නිවාස ඉදිකිරීමේ අරමුණු සඳහා වූ ණය පිළිවෙළින්

**7.2 සංඛ්‍යා සටහන**


**සංචිත මුදල් සහ පුළුල් මුදල් සඳහා තුඩුදුන් සාධක**

රුපියල් බිලියන

| ශීර්ෂය | 2004 අවසානයට | 2005 අවසානයට | වෙනස | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2004 | | 2005 | |
| | | | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| **සංචිත මුදල්** | **171.0** | **197.9** | **29.5** | **20.9** | **27.0** | **15.8** |
| මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් | 151.7 | 196.9 | -12.9 | -7.8 | 45.2 | 29.8 |
| මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් | 19.3 | 1.0 | 42.4 | 183.3 | -18.3 | -94.8 |
| **පුළුල් මුදල් $M_{2b}$** | 858.6 | 1,022.3 | 140.8 | 19.6 | 163.7 | 19.1 |
| ශුද්ධ විදේශීය වත්කම් | 170.2 | 204.8 | 3.1 | 1.9 | 34.6 | 20.3 |
| මූල්‍ය අධිකාරිය | 151.7 | 196.9 | -12.9 | -7.8 | 45.2 | 29.8 |
| වාණිජ බැංකු | 18.5 | 7.9 | 16.0 | 641.7 | -10.6 | -57.3 |
| ශුද්ධ දේශීය වත්කම් | 688.4 | 817.5 | 137.7 | 25.0 | 129.1 | 18.7 |
| දේශීය ණය | 895.9 | 1,034.4 | 164.1 | 22.4 | 138.5 | 15.5 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 220.5 | 246.8 | 44.2 | 25.1 | 26.3 | 11.9 |
| මූල්‍ය අධිකාරිය | 108.1 | 74.4 | 66.0 | 156.6 | -33.7 | -31.2 |
| වාණිජ බැංකු | 112.3 | 172.3 | -21.8 | -16.2 | 60.0 | 53.4 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 41.2 | 16.7 | 5.0 | 13.8 | -24.5 | -59.5 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 634.3 | 771.0 | 114.9 | 22.1 | 136.7 | 21.5 |
| අනෙකුත් අයිතමයන් (ශුද්ධ) | -207.5 | -217.0 | -26.4 | -14.6 | -9.4 | -4.5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**7.3 රූප සටහන**
**දේශීය ණය සංයුතිය සහ පෞද්ගලික අංශයේ ණය වර්ධනය**




සියයට 20 කින් සහ සියයට 17 කින් දයක විය. පෞද්ගලික අංශය සඳහා වූ ණය ප්‍රසාරණයේ අඩු වීමක් වසර අවසානය වනවිට දක්නට ලැබුණි. මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල ලැබීමට යම් කාලයක් ගත වන බැවින් මෙම ණය වර්ධන වේගය තවදුරටත් අඩු වනු ඇතැයි බලාපොරොත්තු විය හැකිය.

- **බැංකු ක්‍රමය වෙතින් රජයේ ශුද්ධ ණය ගැනීම් වර්ධනය වුව ද, 2005 වසරේ වර්ධනය, 2004 වසරේ වර්ධනයට වඩා අඩු මට්ටමක පැවතුණි.** 2004 වසර තුළදී බැංකු ක්‍රමය තුළින් රජයේ ශුද්ධ ණය ගැනීම් වූ රුපියල් බිලියන 43 හා සසඳන විට 2005 වසරේදී එහි වර්ධනය රුපියල් බිලියන 26 ක් විය. 2005 වසරේ රජයේ ශුද්ධ ණය ගැනීම්වල වර්ධනය, වාණිජ බැංකු වෙතින් ලබාගත් ණය රුපියල් බිලියන 60 කින් වැඩිවීමෙහි සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබාගත් ණය රුපියල් බිලියන 33.7 කින් අඩුවීමෙහි ශුද්ධ ප්‍රතිඵලයක් විය. දේශීය වෙළෙඳපොළෙහි පොලී අනුපාතිකවලට ඇතිවිය හැකි පීඩනය අවම කර ගැනීමේ සහ අරමුදල් පිරිවැය පාලනය කර ගැනීමේ අදහසින් රජය විසින් වාණිජ බැංකු වෙතින් විදේශ ව්‍යවහාර මුදල් ණය ලබා ගැනීමට කටයුතු කරන ලදී. වාණිජ බැංකු වෙතින් රජය ලබාගත් ශුද්ධ ණය වැඩිවීමට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන් වෙතින් ලබාගත් ණය රුපියල් බිලියන 43 කින් වැඩිවීම, වාණිජ බැංකු සතු රජයේ සුරැකුම්පත් දැරීම් රුපියල් බිලියන 19.6 කින් වැඩිවීම සහ වාණිජ බැංකු විසින් රජයට සපයන ලද අයිරා පහසුකම් රුපියල් බිලියන 6.3 කින් වැඩිවීම ඇතුළත් විය. මහ බැංකුව විසින් රජයට සපයන ලද තාවකාලික අත්තිකාරම් රුපියල් බිලියන 5 කින් වර්ධනය විය. කෙසේ වුවද, විදේශ ව්‍යවහාර මුදල් ලැබීම් වැඩිවීම හේතුවෙන් වෙළෙඳපොළ තුළ ජනිත වූ ඉහළ ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීම නිසා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් රුපියල් බිලියන 38 කින් අඩුවීම, බැංකු ක්‍රමය වෙතින් රජය ලබාගත් ණය වර්ධනය තරමක් දුරට සමනය වීමට උපකාරී විය.

- **ප්‍රධාන වශයෙන් රජය විසින් ඛනිජ තෙල් ආනයනය පිණිස ණය පහසුකම් 2 ක් ලබා ගැනීම සඳහා විධිවිධාන සැලසීම හේතුවෙන් රාජ්‍ය සංස්ථාවලට දුන් ණය රුපියල් බිලියන 24.5 කින් 2005 වසරේදී අඩු විය.** ණය අඩු වීමෙන් සියයට 91 කට පමණ දයක වූයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වාණිජ බැංකු වෙතින් ලබාගත් ණය ආපසු ගෙවීම වූ අතර, ඉතිරි කොටසට දයක වූයේ ලංකා විදුලි බල මණ්ඩලය විසින් ණය ආපසු ගෙවීමයි. ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඛනිජ තෙල් මිල ඉහළ ගිය ද, ලංකා ඛනිජ තෙල් නීතිගත ස්ථාවට වාණිජ බැංකු වෙත ඇති සිය කෙටිකාලීන යවලින් සියයට 95 ක් හෙවත් රුපියල් බිලියන 22 ක් පමණ ආපසු ගෙවීමට හැකි විය. මෙයට හේතු වූයේ ඉන්දියාවෙන් ඛනිජ තෙල් ආනයනය සඳහා ශ්‍රී ලංකා රජය විසින් එම රජයෙන් ලබාගත් එක්සත් ජනපද ඩොලර් දශලක්ෂ 150 ක් වූ දිගුකාලීන ණය පහසුකම්, දේශීය ඛනිජ තෙල් මිල සංශෝධනය කිරීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාඩු පියවීම වෙනුවෙන් රජය විසින් ගෙවිය යුතු සහනාධාර මුදල් ගෙවීම යනාදියයි. මෙයට අමතරව, ඉරානය විසින් ද ඛනිජ තෙල් ආනයනය සඳහා එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 150 ක කෙටිකාලීන ණය පහසුකමක් ලබාදුන් අතර, වසර තුළදී එය ආපසු ගෙවා නිම කරන ලදී. ලංකා විදුලි බල මණ්ඩලයේ වාණිජ බැංකු වෙත වූ වගකීම් ද රුපියල් බිලියන 2.7 කින් අඩු වුව ද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික විදුලිය නිෂ්පාදන සමාගම් වැනි අනෙකුත් අංශවලට එහි ඇති වගකීම් ඉහළ ගියේය.

**7.3 සංඛ්‍යා සටහන**
**වාණිජ බැංකු ණය හා අත්තිකාරම්හි ආංශික ව්‍යාප්තිය(අ)**

රුපියල් බිලියන

| අංශය | 2004 අවසානයට | 2005 අවසානයට | එකතුවේ ප්‍රතිශතයක් ලෙස: 2005 අවසානයට | වෙනස % | |
|---|---|---|---|---|---|
| | | | | 2004 | 2005 |
| වාණිජ | 186.1 | 213.4 | 32.6 | 18.3 | 14.7 |
| එයින් :අපනයන | 50.5 | 48.5 | 7.4 | 31.4 | -4.0 |
| ආනයන | 63.7 | 65.8 | 10.0 | 11.1 | 3.3 |
| මූල්‍ය | 25.0 | 34.0 | 5.2 | 39.9 | 36.1 |
| කෘෂිකාර්මික | 19.8 | 28.1 | 4.3 | 3.7 | 41.7 |
| කර්මාන්ත (ආ) | 52.3 | 63.4 | 9.7 | 12.0 | 21.2 |
| සංචාරක | 7.0 | 9.9 | 1.5 | 20.7 | 40.6 |
| නිවාස | 74.4 | 94.5 | 14.4 | 24.1 | 27.0 |
| පරිභෝජන | 85.0 | 113.4 | 17.3 | 40.7 | 33.5 |
| සේවා | 38.1 | 43.3 | 6.6 | 4.6 | 13.6 |
| අනෙකුත් | 33.1 | 55.3 | 8.4 | 40.8 | 67.3 |
| **එකතුව** | **520.8** | **655.3** | **100.0** | **21.9** | **25.8** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) අත්තිකාරම්වලට එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂයන් හැර ණය, අයිරා හා වට්ටම් කල බිල්පත් ඇතුළත්ය.
(ආ) ඉංජිනේරු සහ ගොඩනැගිලි ව්‍යාපාර, කැණීම් සහ ධීවර කර්මාන්ත සඳහා දෙන ලද අත්තිකාරම් ඇතුළත් වේ.

- **රජය සහ පෞද්ගලික අංශය වෙත ලැබුණු විදේශ විනිමය ලැබීම් ඉහළ යාම නිසා බැංකු ක්‍රමය තුළ වූ ශුද්ධ විදේශ වත්කම් වැඩිවීය. සුනාමි ව්‍යසනයෙන් පසු විදේශ අරමුදල් ලැබීම් සහ පෞද්ගලික ප්‍රේෂණ මෙයට ඇතුළත් විය**. මහ බැංකුව සතු ශුද්ධ විදේශීය වත්කම් එක්සත් ජනපද ඩොලර් දශලක්ෂ 501 කින් වැඩිවීම තුළින් මෙම වැඩිවීම පිළිබිඹු විය. කෙසේ වුවද, රජය වාණිජ බැංකුවලින් විදේශ විනිමය ණය ලබාගැනීම නිසා වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් අඩු වූ අතර, රජය එම ලැබීම් මහ බැංකුවට විකිණීම නිසා මෙම වත්කම් දැරීම්හි සංයුතිය වෙනස් විය.

**මූල්‍ය සමීක්ෂණය**

- **මූල්‍ය සමීක්ෂණය ($M_4$), ද්‍රවශීලතාව පිළිබඳ වඩාත් පුළුල් මිනුමක් වන අතර. ඒ සඳහා ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) ගණනය කිරීමේදී ඇතුළත් වන මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට අමතරව, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ ලියාපදිංචි මූල්‍ය සමාගම් ද ඇතුළත් වේ[2]**. 2005 වර්ෂය තුළ මූල්‍ය සමීක්ෂණය අනුව පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය, $M_{2b}$ හි වර්ධනය වන සියයට 19.4 - 21.5 පරාසය හා සසඳන විට සියයට 17.7 - 19.8 පරාසයේ පැවතිණ.

- **මූල්‍ය සමීක්ෂණයට අනුව රජය වෙත සපයන ලද ශුද්ධ ණය. $M_{2b}$ හි වාර්තා වූ සියයට 13.2 හා සසඳන විට සියයට 15.6 කින් වර්ධනය විය**. බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් රජයේ සුරැකුම්පත්වල කරන ලද ආයෝජන රුපියල් බිලියන 25 කින් වැඩි වූ අතර, ලියාපදිංචි මූල්‍ය සමාගම් රජයේ සුරැකුම්පත්හි කරන ලද ආයෝජන වැඩි වූයේ ආන්තික වශයෙනි. $M_{2b}$ අනුව වාර්තා වූ සියයට 21.5 ක වර්ධනය හා සසඳන විට මූල්‍ය සමීක්ෂණය අනුව පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය වර්ධනය සියයට 21.7 ක් විය. $M_4$ හි සමස්ත ණය ප්‍රසාරණයට බලපත්‍රලාභී විශේෂිත බැංකු, මූල්‍ය සමාගම් සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවල දායකත්වය රුපියල් බිලියන 17 ක්, රුපියල් බිලියන 16 ක් සහ රුපියල් බිලියන 3 ක් විය. මූල්‍ය සමාගම් විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණයෙහි 2004 වර්ෂයේ වාර්තා වූ රුපියල් බිලියන 8 ක වර්ධනය හා සැසඳීමේදී 2005 වර්ෂය තුළදී සැලකිය යුතු වර්ධනයක් පැවතුණි. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කල්බදු පහසුකම් සහ කුලී පිට මිලදී ගැනීම් පහසුකම් යටතේ සපයන ලද ණය ඉහළ යාමයි.

## 7.4 පොලී අනුපාතික

- **මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළයාම, ණය සඳහා පැවති ඉහළ ඉල්ලුම සහ උද්ධමන අපේක්ෂාවන් පිළිබිඹු කරමින් 2005 වර්ෂය තුළදී වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ ගියේය**. වසරේ දෙවන භාගය වනවිට උද්ධමනය මධ්‍යස්ථ මට්ටමකට පැමිණීමත් සමඟ 2004 වසර තුළ අඩු මට්ටමක පැවති විවිධ වෙළෙඳපොළ අංශයන්හි මූර්ත පොලී අනුපාතික වර්ෂය තුළදී ක්‍රමයෙන් වැඩි විය. ලොව ප්‍රධාන ආර්ථිකයන් විසින් පොලී අනුපාතික ඉහළ දැමීමෙන් පසු විදේශ මුදල් තැන්පතු සහ ණය සඳහා වන පොලී අනුපාතික ද ඉහළ ගියේය.

**මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික**

- **2003 වර්ෂයේ සිට 2004 නොවැම්බර් මස දක්වා පැවති අඩු පොලී අනුපාතික ප්‍රතිපත්තිය වෙනස් කරමින් 2005**

**7.4 සංඛ්‍යා සටහන**
**මූල්‍ය සමීක්ෂණය හා තුඩුදුන් සාධක**

රුපියල් බිලියන

| ශීර්ෂය | 2004 අවසානයට | 2005 අවසානයට (අ) | වෙනස | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2004 | | 2005 | |
| | | | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| මූල්‍ය සමීක්ෂණය ($M_4$) | 1,094.1 | 1,293.9 | 165.8 | 17.9 | 199.9 | 18.3 |
| තුඩුදුන් සාධක | | | | | | |
| ශුද්ධ විදේශීය වත්කම් | 161.5 | 195.7 | 3.8 | 2.4 | 34.3 | 21.2 |
| ශුද්ධ දේශීය වත්කම් | 932.6 | 1,098.2 | 162.0 | 21.0 | 165.6 | 17.8 |
| දේශීය ණය | 1,205.2 | 1,411.4 | 196.4 | 19.5 | 206.2 | 17.1 |
| රජයේ ශුද්ධ ණය ගැනීම් | 354.1 | 409.4 | 46.6 | 15.2 | 55.2 | 15.6 |
| රාජ්‍ය සංස්ථාවලට දුන් ණය | 41.6 | 16.7 | 4.8 | 13.1 | -25.0 | -59.9 |
| පෞද්ගලික අංශයට දුන් ණය | 809.5 | 985.4 | 145.0 | 21.8 | 175.9 | 21.7 |
| අනෙකුත් අයිතමයන් (ශුද්ධ) | -272.6 | -313.2 | -34.4 | -14.4 | -40.6 | 14.9 |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

[2] මුදල් සැපයුමෙහි ($M_{2b}$) හි ඇතුළත් වන වත්කම්වලට වඩා මූල්‍ය සමීක්ෂණයෙහි ඇතුළත් ඇතැම් වත්කම් ද්‍රවශීලතාවෙන් අඩුය. මූල්‍ය සමීක්ෂණය තුළින් ද්‍රවශීලතාව පිළිබඳ සපයන මිනුමට වඩා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී අතරමැදි ඉලක්කයක් වශයෙන් $M_{2b}$ වඩාත් සුදුසු මිනුමක් ලෙස සැලකේ.

**7.5 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්තිමය පොලී අනුපාතිකයන්හි වෙනස්වීම**

සියයට

| දිනය | ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය | ප්‍රතිවිකුණුම් අනුපාතිකය | බැංකු අනුපාතිකය |
|---|---|---|---|
| 2002.11.22 | 9.75 | 11.75 | 18.00 |
| 2003.01.07 | 9.00 | 11.00 | 18.00 |
| 2003.05.09 | 8.25 | 10.25 | 18.00 |
| 2003.08.15 | 7.50 | 9.50 | 15.00 |
| 2003.10.16 | 7.00 | 8.50 | 15.00 |
| 2004.11.10 | 7.50 | 9.00 | 15.00 |
| (ව්‍යාපාරික කටයුතු අවසානයේ සිට) | | | |
| 2005.05.13 | 7.75 | 9.25 | 15.00 |
| 2005.06.15 | 8.25 | 9.75 | 15.00 |
| 2005.09.13 | 8.50 | 10.00 | 15.00 |
| 2005.12.22 | 8.75 | 10.25 | 15.00 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**7.6 සංඛ්‍යා සටහන**

**මුදල් වෙළෙඳපොළ අනුපාතික (අ)**

සියයට

| දිනය | ශ්‍රී.ලං.ම.බැංකු ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය | බරිත සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි අනුපාතිකය | බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය | ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (එක්දින) |
|---|---|---|---|---|
| දෙසැ.'03 | 7.00 | 7.04 | 7.59 | 7.73 |
| දෙසැ.'04 | 7.50 | 7.84 | 9.73 | 9.66 |
| මාර්තු'05 | 7.50 | 7.56 | 7.77 | 8.23 |
| ජූනි '05 | 8.25 | 8.58 | 8.97 | 9.22 |
| සැප්. '05 | 8.50 | 9.15 | 10.14 | 10.31 |
| දෙසැ '05 | 8.75 | 9.29 | 10.73 | 10.93 |

(අ) මාසය අවසානයේ දී අගයන්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**වර්ෂය තුළදී මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික එනම් ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකිණුම් පොලී අනුපාතික ක්‍රමයෙන් ඉහළ නංවන ලදී**. අපේක්ෂිත මට්ටමට වඩා වැඩි වේගයකින් වර්ධනය වූ ණය හා මුදල් සමස්තයන් සීමා කිරීමටත්, උද්ධමනය හා උද්ධමනාත්මක පීඩන අඩු කිරීමටත් පොලී අනුපාතික ඉහළ නැංවීම අවශ්‍ය විය. පොලී අනුපාතික ඉහළ නැංවීම ආරම්භ වූයේ 2004 නොවැම්බර් මස ප්‍රතිමිලදී ගැනුම් හා ප්‍රතිවිකුණුම් අනුපාතික පදනම් අංක 50 කින් , පිළිවෙළින්, සියයට 7.50 සහ සියයට 9.00 දක්වා ඉහළ නැංවීමත් සමගය. 2005 වර්ෂය තුළදී මහ බැංකුව විසින් තව දුරටත් අවස්ථා 4 කදී පදනම් අංක 125 කින් පොලී අනුපාතික ඉහළ නංවමින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කරන ලදී. එනම්, මැයි මස පදනම් අංක 25 කින්, ජූනි මස පදනම් අංක 50 කින්, සැප්තැම්බර් මස පදනම් අංක 25 කින් හා දෙසැම්බර් මස පදනම් අංක 25 කින් වශයෙනි.

- **බැංකු පොලී අනුපාතිකය නොවෙනස්ව පැවතිණ**. බැංකු පොලී අනුපාතිකය යනු වාණිජ බැංකුවල හදිසි ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා රජයේ සුරැකුම්පත්, රන් හා වාණිජ බිල්පත් යනාදිය ඇප වශයෙන් පිළිගෙන මහ බැංකුව විසින් ණය සැපයීමේදී අයකරනු ලබන පොලී අනුපාතිකය වන අතර, 2005 දී එය සියයට 15 මට්ටමේම පැවතිණ. කෙසේ වුවද, බැංකු පොලී අනුපාතිකය යටතේ සාමාන්‍යයෙන් වාණිජ බැංකු මහ බැංකුවෙන් ණය ලබා නොගන්නා හෙයින් එය හුදෙක් භාවිතයට ගනු නොලබන පොලී අනුපාතිකයක් ලෙස සැලකිය හැකිය.

**මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතික**

- **2005 වර්ෂය තුළ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීමත් සමඟ මුදල් වෙළෙඳපොළෙහි පොලී අනුපාතික ද ඉහළ ගියේය**. 2004 අවසානයේ සියයට 7.84 ක් වූ දෛනික ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසියේ බරිත සාමාන්‍ය ඵලද අනුපාතිකය, දෛනික විවට වෙළෙඳපොළ කටයුතු තුළින් ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම නැවත ආරම්භ කිරීමත් සමඟ 2005 පෙබරවාරි මස මැද වන විට සියයට 7.55 දක්වා පහත වැටිණ. මාර්තු මාසයෙන් පසුව අතිරික්ත ද්‍රවශීලතාව ස්ථිර පදනමකින් අවශෝෂණය කරමින් වඩාත් දැඩි ලෙස විවට වෙළෙඳපොළ කටයුතු සිදු කිරීමත් සමඟ අතිරික්ත ද්‍රවශීලතාව ශීඝ්‍රයෙන් අඩු වූ අතර, දෛනික ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසියේ බරිත සාමාන්‍ය ඵලද අනුපාතිකය ඉහළ ගියේය. මෙම ක්‍රියා මාර්ග අඛණ්ඩව අනුගමනය කිරීම සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික සංශෝධනය කිරීම හේතුවෙන් ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි ඵලද අනුපාතිකය ක්‍රමයෙන් පොලී අනුපාතික පරාසයේ මධ්‍යය දක්වා ඉහළ ගිය අතර, 2005 දෙසැම්බර් මස අග වනවිට එය සියයට 9.29 ක් විය.

- **විවට වෙළෙඳපොළ වෙන්දේසි ඵලද අනුපාතික වෙනස්වීම වෙනත් කෙටිකාලීන පොලී අනුපාතික තුළින් ද පිළිබිඹු විය**. විවට වෙළෙඳපොළ වෙන්දේසි තාවකාලිකව අත්හිටුවීමත් සමඟ ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය[3] (SLIBOR) පහත වැටුණි. කෙසේ වුවද, විවට වෙළෙඳපොළ වෙන්දේසි තුළින් දිනපතා ද්‍රවශීලතා අවශෝෂණය නැවත ඇරඹීමත් සමඟ මෙම පොලී අනුපාතිකය ද ඉහළ ගියේය. බරිත සාමාන්‍ය ඒක්ෂණ පොලී අනුපාතිකයෙහි ද මෙම ප්‍රවනතාවය දක්නට ලැබුණි. එය 2004 දෙසැම්බර් මස සියයට 9.73 සිට 2005 මාර්තු මස අවසානය වනවිට සියයට 7.61 දක්වා 2005 වසර තුළ වූ අඩුම මට්ටමට පහත වැටුණු අතර, පසුව ක්‍රමානුකූලව ඉහළ යමින් 2005 දෙසැම්බර් මස අවසානය වනවිට සියයට 10.73 ක් දක්වා වැඩි වී තිබුණි.

**තැන්පතු සහ ණය අනුපාතික**

- **2005 වර්ෂය තුළදී බැංකු පද්ධතියේ තැන්පතු සහ ණය පොලී අනුපාතික ඉහළ ගියේය**. තැන්පතු අනුපාතික, විශේෂයෙන් ස්ථිර තැන්පතු පොලී අනුපාතික ඉහළ නැංවීම සමඟ සාමාන්‍ය පොලී ඉපැයුම් සහ සාමාන්‍ය පොලී පිරිවැය යන දෙකෙහි වෙනස මගින් ගණනය

3. ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය යනු වාණිජ බැංකු 12 ක් විසින් අන්තර් බැංකු රුපියල් ගනුදෙනු සඳහා ඉදිරිපත් කරනු ලබන පොලී අනුපාතිකවල සාමාන්‍යයයි.

**විශේෂ සටහන 15**

## මෑතකාලීන ජාත්‍යන්තර මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

ලෝක ආර්ථික පසුබෑම ආරම්භවීමත් සමග ම 2001 දී ලොවපුරා බොහොමයක් මහ බැංකු ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට පෙළඹුණි. මෙම ආර්ථික පසුබෑම, අස්ථාවර භූ දේශපාලනික තත්ත්වයන්, විශේෂයෙන් 2001 වසරේ දී ඇමරිකා එක්සත් ජනපදයට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය හේතුවෙන් වඩා තීව්‍ර විය. බොහොමයක් කාර්මික රටවල මෙන්ම නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හි දිගු කලක් තිස්සේ පැවති අඩු උද්ධමන වාතාවරණය විසින් මූල්‍ය අංශයේ ලිහිල් බව සඳහා අනුබල දෙන ලදී. දේශීය මෙන්ම විදේශීය ආර්ථිකයන්හි පැවති වර්ධනීය තත්ත්වය ඉහළ මට්ටමකට පත්වීම, උද්ධමනාත්මක පීඩන පිළිබඳ සංඥා පහළවීම හා ඉහළයමින් පැවති වත්කම් මිල ගණන් හේතුවෙන් මිල ස්ථායීතාව පිළිබඳ අවධානය යොමුවීම යන හේතු මත බොහොමයක් මහ බැංකු මූල්‍ය අංශයේ පැවති ලිහිල් බව ක්‍රමානුකූලව ඉවත් කිරීමට කටයුතු කළහ.

දියුණු ආර්ථිකයන් අතර, එක්සත් ජනපදය සිය ෆෙඩරල් පොලී අනුපාතිකය (Target Federal Funds Rate) 2004 ජූනි සහ 2006 මාර්තු අතර කාලය තුළ පහළොස් වතාවක දී පදනම් අංක 375 කින්, ක්‍රමානුකූලව ඉහළ නංවමින් ලිහිල් මුදල් ප්‍රතිපත්තියෙන් ක්‍රමයෙන් ඉවත් විය. එංගලන්ත බැංකුව, ඔස්ට්‍රේලියානු සංචිත බැංකුව සහ කැනඩා මහ බැංකුව, විශේෂයෙන් ඉහළ යමින් පවතින මූර්ත වත්කම් මිල ගණන්වලින් පිළිබිඹු වූ ඉල්ලුම් පාර්ශ්වයේ පීඩන සැලකිල්ලට ගනිමින් සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවූහ. යුරෝපීය මහ බැංකුව වසර දෙකහමාරක් පමණ දිගුකාලයක් තිස්සේ පහළ මට්ටමක පවත්වාගත් සිය ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (ප්‍රධාන ප්‍රතිමූලන පොලී අනුපාතිකය) 2005 දෙසැම්බර් මස දී ඉහළ නැංවීය. ආසියානු කලාපයේ ආර්ථිකයන් අතර, කොරියානු මහ බැංකුව, මැලේසියානු නෙගාරා බැංකුව, තායිලන්ත මහ බැංකුව, ඉන්දීය සංචිත බැංකුව සහ පාකිස්ථාන රාජ්‍ය බැංකුව ද මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ක්‍රමයෙන් දැඩි කිරීමට කටයුතු කළහ.

**සංඛ්‍යා සටහන වි. ස. 15.1**

**ප්‍රධාන ආර්ථිකයන්හි සහ නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හි ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ උද්ධමන අනුපාතික**

| කාලච්ඡේදය අවසානයට | ප්‍රතිපත්ති පොලී අනුපාතික | | | | | | | | | සියයට |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඇ.එ.ජ. | මහ බ්‍රිතාන්‍යය | යූරෝ කලාපය | කැනඩාව | ඔස්ට්‍රේලියාව | මැලේසියාව | තායිලන්තය | කොරියාව | ඉන්දියාව | පකිස්ථානය |
| | ෆෙඩරල් අරමුදල් අනුපාතිකය | ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය | ප්‍රධාන ප්‍රතිමූල්‍ය අනුපාතිකය | ඉලක්කගත එක් දින අනුපාතිකය | මුදල් අනුපාතිකය | එක් දින ප්‍රතිපත්තිමය පොලී අනුපාතිකය | දින 14 ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය | අන්තර් බැංකු ප්‍රධාන පොලී අනුපාතිකය | ප්‍රතිවිකුණුම් අනුපාතිකය | ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය (වට්ටම් අනුපාතිකය) |
| දෙසැ : 01 | 1.75 | 4.00 | 3.25 | 2.25 | 4.25 | 2.75 | 2.25 | 4.00 | 6.50 | 13.00 |
| දෙසැ : 02 | 1.25 | 4.00 | 2.75 | 2.75 | 4.75 | 2.70 | 1.75 | 4.25 | 5.50 | 10.00 |
| දෙසැ : 03 | 1.00 | 3.75 | 2.00 | 2.75 | 5.25 | 2.75 | 1.25 | 3.75 | 4.50 | 7.50 |
| දෙසැ : 04 | 2.25 | 4.75 | 2.00 | 2.50 | 5.25 | 2.70 | 2.00 | 3.25 | 4.75 | 7.50 |
| ජූනි : 05 | 3.25 | 4.75 | 2.00 | 2.50 | 5.50 | 2.70 | 2.50 | 3.25 | 5.00 | 9.00 |
| දෙසැ : 05 | 4.25 | 4.50 | 2.25 | 3.25 | 5.50 | 3.00 | 4.00 | 3.75 | 5.25 | 9.00 |
| මාර්තු : 06 | 4.75 | 4.50 | 2.50 | 3.75 | 5.50 | 3.00 | 4.50 | 4.00 | 5.50 | 8.75 |
| | උද්ධමනය | | | | | | | | | |
| 2001 | 1.60 | 1.10 | 2.00 | 0.70 | 6.00 | 3.20 | 0.70 | 4.10 | 3.80 | 5.40 |
| 2005 | 3.40 | 1.90 | 2.20 | 2.20 | 2.40 | 3.30 | 5.80 | 2.60 | 3.90 | 8.50 |

කරනු ලබන පොලී අනුපාතික අන්තරය ආන්තික වශයෙන් අඩු වුවද, එය තවමත් ඉහළ මට්ටමක පවතී.


- **බරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතිකය (AWDR)[4] 2004 දෙසැම්බර් මස අගදී පැවති සියයට 5.31 සිට 2005 දෙසැම්බර් මස අවසානය වන විට සියයට 6.24 දක්වා ඉහළ ගියේය**. බරිත සාමාන්‍ය ස්ථිර තැන්පතු පොලී අනුපාතිකය (AWFDR) එම කාල පරිච්ඡේදය තුළදී සියයට 7.67 සිට සියයට 9.25 දක්වා ඉහළ ගියේය.

- **වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකය (AWPR)[5] වසර ආරම්භයේදී පහළ ගියද**.

4. බරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතිකය යනු වාණිජ බැංකුවල පොලී ගෙවනු ලබන සියලුම තැන්පතු සඳහා වන පොලී අනුපාතිකයන්හි බර තැබූ සාමාන්‍යයයි.

5. බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකය යනු වාණිජ බැංකු විසින් සිය' වඩාත් විශ්වාසදායී (ප්‍රමුඛ) ගනුදෙනුකරුවන්ට ණය සැපයීමේදී අය කරනු ලබන පොලී අනුපාතිකයන්හි සාමාන්‍යය වේ.

**7.4 රූප සටහන**
**මුදල් වෙළෙඳපොළ අනුපාතික**




**පසුව ක්‍රමයෙන් ඉහළ ගියේය.** 2004 අගදී සියයට 10.23 ක්වූ ප්‍රමුඛ ණය දීමේ පොලී අනුපාතිකය විවට වෙළෙඳපොළ වෙන්දේසි පොලී අනුපාතික සහ ඒක්ෂණ වෙළෙඳපොළ පොලී අනුපාතික පහළ යාමත් සමග 2005 පෙබරවාරි වන විට සියයට 9.76 දක්වා පහත වැටිණ. එතැන් පටන් එය ක්‍රමයෙන් ඉහළ ගිය අතර, 2005 දෙසැම්බර් මස අවසානය වන විට සියයට 12.24 ක් විය. වාණිජ බැංකුවල දේශීය බැංකු ඒකකයන් හි සමස්ත ණය කළඹට අදළ සාමාන්‍ය ණය දීමේ පොලී අනුපාතිකය වන බරිත සාමාන්‍ය ණය දීමේ පොලී අනුපාතිකය (AWLR) 2004 දෙසැම්බර් මස සියයට 14.8 සිට 2005 දෙසැම්බර් වන විට සියයට 15.4 දක්වා ඉහළ ගියේය. ණය කාඩ්පත්හි නොපියවූ ශේෂයන් සඳහා අය කරනු ලබන පොලී අනුපාතික සාමාන්‍යයෙන් දඩ පොලී අනුපාතික ලෙස සැලකෙන අතර, එම පොලී අනුපාතික 2004 දෙසැම්බර් මස පැවති සියයට 21 - 33 අතර පරාසයක සිට 2005 දෙසැම්බර් වන විට සියයට 29-34 අතර පරාසයක් දක්වා වැඩි විය.

- **වෙළෙඳපොළ පොලී අනුපාතිකයන්ගේ ඉහළයාම පිළිබිඹු කරමින් දිගු කාලීන ණය දෙන ආයතනයන්හි තැන්පතු සහ ණය පොලී අනුපාතික ඉහළ ගියේය. කෙසේ වුවද, දිගුකාලීන ණය දෙන ආයතනයන් විසින් නිවාස ණය සැපයීමේදී අය කරනු ලබන පොලී අනුපාතික 2005 වර්ෂය තුළදී නොවෙනස්ව පැවතිණ.** ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ඉතිරිකිරීමේ තැන්පතු සඳහා ගෙවනු ලබන පොලී අනුපාතිකය සියයට 5 මට්ටමෙහි නොවෙනස්ව පැවති අතර, එක් අවුරුදු ස්ථිර තැන්පතු සඳහා ගෙවනු ලබන පොලී අනුපාතිකය සියයට 8 සිට සියයට 9 දක්වා වැඩි විය. විශේෂ තැන්පතු යෝජනා ක්‍රම, එනම් විශේෂයෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන තැන්පතු යෝජනා ක්‍රම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් අඛණ්ඩව ඉහළ පොලී අනුපාතික ගෙවන ලදී. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සහ සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව ද තැන්පතු සඳහා ගෙවනු ලබන පොලී අනුපාතික ඉහළ නංවන ලදී. ජාතික ඉතිරි කිරීමේ බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සහ ඩී.එෆ්.සී.සී. බැංකුව නිවාස ණය සඳහා අය කරන පොලී අනුපාතික නොවෙනස්ව පැවතිණ.

- **එක සමාන අගයක් ගත්තා නෛතික පොලී අනුපාතිකය සහ වෙළෙඳපොළ පොලී අනුපාතිකය ද ඉහළ ගියේය.**[6] බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතික මත පදනම්ව ගණනය කර මහ බැංකුව විසින් සෑම වර්ෂයකම රජයේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන නෛතික පොලී අනුපාතිකය සහ වෙළෙඳපොළ අනුපාතිකය 2005 දී සියයට 5.16 ක් වූ අතර, 2006 වර්ෂය සඳහා සියයට 5.7 ක් විය.


- **ප්‍රධාන ජාත්‍යන්තර ව්‍යවහාර මුදල්වලට අදළ ජාත්‍යන්තර පොලී අනුපාතික ඉහළ යාමත් සමග විදේශ මුදල් තැන්පතු සහ ණය පොලී අනුපාතික ද ඉහළ ගියේය.**

**රජයේ සුරැකුම්පත් මත ඵලද අනුපාතික**

- **වසර මැදදී සාපේක්ෂ වශයෙන් ඉහළ අනුපාතිකයකින් වර්ධනය වූ රජයේ සුරැකුම්පත් මත වූ ඵලද අනුපාතික උද්ධමනය මධ්‍යස්ථ මට්ටමකට පැමිණීමත් සමග වසර අග වන විට යම් ස්ථායීතාවයක් පෙන්නුම් කළේය.** රජයේ සුරැකුම්පත්වල කාල ව්‍යුහය සැලකිල්ලට ගත් විට, කෙටිකාලීන රාජ්‍ය සුරැකුම්පත් සඳහා වෙළෙඳපොළෙහි වැඩි කැමැත්තක් දක්නට ලැබුණු අතර, එය අනාගත පොලී අනුපාතික හැසිරීම් පිළිබඳ වෙළෙඳපොළේ අවිනිශ්චිතභාවය පෙන්නුම් කිරීමක් විය හැකිය. කෙසේ වුවද, ඉහළට නැඹුරුව තිබූ ඵලද වක්‍රය වසර අවසානය වනවිට පැතලි ස්වරූපයක් පෙන්නුම් කළේය.

- **භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළෙඳපොළෙහි දින 364 බිල්පත් සඳහා වන ඵලද අනුපාතිකවල වැඩි වීම දින 91 බිල්පත් සඳහා වන ඵලද අනුපාතිකවල වැඩිවීමට වඩා අඩුවෙන් සිදු විය.** 2005 වසර තුළදී දින 91 භාණ්ඩාගාර බිල්පත්හි ඵලද අනුපාතික පදනම් අංක 285 කින් වැඩි වූ අතර, දින 364 භාණ්ඩාගාර බිල්පත් හි ඵලද අනුපාතික වැඩි වූයේ පදනම් අංක 272 කිනි. භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ඵලද

**7.5 රූප සටහන**
**වාණිජ බැංකු තැන්පතු සහ ණය පොලී අනුපාතික**




6. නෛතික පොලී අනුපාතිකය 1990 අංක 6 දරන සිවිල් නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනතේ නිර්වචනය කර ඇති අතර, එය මුදලක් අයකර ගැනීම සම්බන්ධයෙන් වූ ඕනෑම නීතිමය ක්‍රියා මාර්ගයකදී අදළ වෙයි. වෙළෙඳපොළ පොලී අනුපාතිකය, 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ නිර්වචනය කර ඇති අතර, ණය දෙන ආයතනයක් විසින් වාණිජමය ගනුදෙනුවක් සම්බන්ධයෙන් වූ රුපියල් 150,000 කට වඩා වැඩි වූ ණයක් අයකර ගැනීමේදී ඒ සඳහා එකඟ වූ පොලී අනුපාතිකයක් නොමැති විටෙක වෙළෙඳපොළ පොලී අනුපාතිකය අදළ වෙයි.

අනුපාතික ද මෙයට සමාන ප්‍රවනතාවයක් පෙන්නුම් කළේය. තුන් අවුරුදු බැඳුම්කර සඳහා වන ඵලද අනුපාතික පදනම් අංක 262 කින් වැඩි වීම හා සැසඳීමේදී සිවු අවුරුදු බැඳුම්කර සඳහා වූ ඵලද අනුපාතික පදනම් අංක 225 කින් වැඩි විය.

- **රජයේ සුරැකුම්පත් සඳහා වන ද්විතීයික වෙළෙඳපොළෙහි ඵලද වක්‍රය 2005 අවසානය වනවිට පැතලි සවරූපයක් ගත් අතර, ප්‍රාථමික වෙළෙඳපොළ සහ ද්විතීයික වෙළෙඳපොළ ඵලද අනුපාතික අතර පරතරය අඩු විය.**
- **භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන ඵලද අනුපාතික ඉහළ යැමත් සමඟ, රුපියල් සුරැකුම්පත් සඳහා වන පොලී අනුපාතික ද ඉහළ ගියේය.** ආපසු කැඳවීමේ හිමිකම සහ ඉහළ ඵලද අනුපාතික සහිත රුපියල් සුරැකුම්පත් ආපසු කැඳවන ලදී. වසර ආරම්භයේදී සියයට 9.15 ක්වූ රුපියල් සුරැකුම්පත් සඳහා වන පොලී අනුපාතික වසර අවසානය වනවිට සියයට 11 දක්වා ඉහළ ගියේය
- **මිල දර්ශකයකට සම්බන්ධ කරන ලද ඵලද අනුපාතිකයකින් සමන්විත තුන් අවුරුදු පරිණත කාලයක් සහිත රුපියල් බිලියන 21ක් වටිනා බැඳුම්කර රජය විසින්**

**7.7 සංඛ්‍යා සටහන**

**තැන්පතු හා ණය පොලී අනුපාතික (අ)**

සියයට

| ආයතනය | 2004 අවසානයට | 2005 අවසානයට |
|---|---|---|
| **වාණිජ බැංකු** | | |
| **තැන්පතු පොලී අනුපාතික** | | |
| ඉතිරි කිරීමේ තැන්පතු | 3.00-7.75 | 3.00-10.25 |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය | 5.31 | 6.24 |
| බරිත සාමාන්‍ය ස්ථිර තැන්පතු අනුපාතිකය | 7.67 | 9.25 |
| **ණය දීමේ පොලී අනුපාතික** | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකය | 10.23 | 12.24 |
| බරිත සාමාන්‍ය ණය දීමේ අනුපාතිකය | 14.80 | 15.10 |
| **වාණිජ බැංකු නොවන ආයතන** | | |
| **තැන්පතු පොලී අනුපාතික** | | |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | |
| ඉතිරි කිරීමේ තැන්පතු | 5.00 | 5.00 |
| එක් අවුරුදු ස්ථිර තැන්පතු | 8.00 | 9.00 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | | |
| එක් අවුරුදු ස්ථිර තැන්පතු | 8.00 | 9.20 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව | | |
| එක් අවුරුදු ස්ථිර තැන්පතු | 8.25 | 10.00 |
| **ණය දීමේ පොලී අනුපාතික** | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව (ආ) | 10.00-12.00 | 10.00-12.00 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (ආ) | 12.00-13.25 | 12.00-13.25 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව | 9.25-16.00 | 5.00-17.00(ඇ) |
| ජාතික සංවර්ධන බැංකුව | 9.60-16.00 | 12.25-15.00 |
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 11.00 | 11.00 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) වාණිජ බැංකු හා වාණිජ බැංකු නොවන මූල්‍ය ආයතන සපයන ලද අනුපාතික මත පදනම් වේ.
(ආ) නිවාස ණය පමණි.
(ඇ) සුනාමි හා වෙනත් විශේෂ සහනශීලී ණය යෝජනා ක්‍රමද ඇතුළත් අනුපාතික.

**7.8 සංඛ්‍යා සටහන**

**රජයේ සුරැකුම් පත් ඵලද අනුපාතික**

සියයට

| | 2004 දෙසැම්බර් අවසානයට | 2005 ජූනි අවසානයට | 2005 දෙසැම්බර් අවසානයට |
|---|---|---|---|
| **ප්‍රාථමික වෙළෙඳපොළ** | | | |
| භාණ්ඩාගාර බිල්පත් | | | |
| දින 91 | 7.25 | 9.01 | 10.10 |
| දින 182 | 7.40 | 9.16 | 10.32 |
| දින 364 | 7.65 | 9.25 | 10.37 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | | |
| වර්ෂ 2 | 8.25 | 10.32 | 10.39 (අ) |
| වර්ෂ 3 | 8.60 | 9.82 | 11.22 |
| වර්ෂ 4 | 8.75 | - | 11.10 |
| රුපියල් ණය | 8.90 | 9.15 | 11.00 |
| **ද්විතීයික වෙළෙඳපොළ** | | | |
| භාණ්ඩාගාර බිල්පත් | | | |
| දින 91 | 7.21 | 8.94 | 10.04 |
| දින 182 | 7.33 | 8.76 | 10.22 |
| දින 364 | 7.59 | 9.16 | 10.31 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | | |
| වර්ෂ 2 | 8.30 | 10.07 | 10.72 |
| වර්ෂ 3 | 8.74 | 10.42 | 11.15 |
| වර්ෂ 4 | 9.34 | 10.50 | 11.28 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


(අ) වර්ෂ 2 භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන අවසාන වෙන්දේසිය පවත්වන ලද්දේ 2005 ජූලි මසදීය.

**නිකුත් කරන ලදී.** මෙම බැඳුම්කර සඳහා පළමු වර්ෂයේදී සියයට 11.2 ක කූපන් පොලී අනුපාතිකයක් හිමිවන අතර, දෙවන හා තෙවැනි වර්ෂවලදී කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍යයට වඩා සියයට එකකින් වැඩි කූපන් පොලී අනුපාතිකයක් හිමි වේ.

### සාංගමික ණය සුරැකුම් මත ඵලද අනුපාතික

- **2005 වර්ෂය තුළදී සමාගම්හි ණය සුරැකුම් සඳහා වන ඵලද අනුපාතික ද ඉහළ ගියේය.** විශාල සමාගම්හි කෙටි කාලීන ණය ගැනීම් සඳහා භාවිතා කරනු ලබන උපකරණයක් වන වාණිජ පත්‍ර සඳහා වන පොලී අනුපාතික 2004 අවසානයේ පැවති සියයට 9.50 - 13.75 අතර පරාසය සමඟ සසඳන විට 2005 වසර අවසානය වන විට සියයට 9.00 - 14.25 අතර පරාසයක් දක්වා එම අනුපාතික ඉහළ ගියේය. සෙලාන් මර්චන්ට් ලීසිං සමාගම සියයට 10.25 - 12.50 අතර පරාසයක පොලී අනුපාතිකයකින් සමන්විත ඇපකර රහිත, පාලිත, නිදහස් කළ හැකි ණයකර නිකුත් කළේය. සෙංකඩගල ෆිනෑන්ස් සමාගම ද වසර තුළදී ස්ථාවර පොලී අනුපාතික සහිත ණයකර නිකුතුවක් සහ විචල්‍ය පොලී අනුපාතික සහිත ණයකර නිකුතුවක් කළ අතර, ඒවා ඇපකර රහිත, පාලිත, නිදහස් කළ හැකි ණයකර විය. ස්ථාවර පොලී අනුපාතික සහිත ණයකරවල පොලී අනුපාතිකය

**7.6 රූප සටහන**
**රජයේ සුරැකුම්පත් සඳහා ද්විතියික වෙළඳපොළ ඵලද වක්‍රය**




සියයට 14 ක් වූ අතර, විචල්‍ය පොලී අනුපාතික සහිත ණයකර පොලිය, මාස 3 භාණ්ඩාගාර බිල්පත් ඵලද අනුපාතිකයට පදනම් අංක 275 ක් එකතු කරන ලද පොලී අනුපාතිකයකින් සමන්විත විය.

## 7.5 මුදල් ප්‍රතිපත්තිය : වර්ධනයන් සහ ගැටලු

- **මුදල් කළමනාකරණය වර්ධනය කිරීම සඳහා පසුගිය කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියා මාර්ග ගණනාවක් ගෙන ඇත.** වෙළෙඳපොළ ක්‍රමය මත පදනම්ව මුල්‍ය ක්‍රමය හැසිරවීමේ කටයුතු ශක්තිමත් කිරීම, වෙළෙඳපොළ සහභාගිවන්නන් අතර තරගකාරීත්වය ඇති කිරීම සඳහා තවදුරටත් පහසුකම් සැලසීම සහ සාමාන්‍ය මහජනතාවට ක්‍රමවත්ව තොරතුරු සැපයීම තුළින් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ විනිවිදභාවය අඛණ්ඩව පවත්වා ගැනීම සිදු විය.

- **වඩාත් නියෝජනාත්මක මිල දර්ශකයන් සහ උද්ධමනාත්මක අපේක්ෂාවන් පිළිබඳ දර්ශකයන් මගින් මුදල් ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග සඳහා මඟ පෙන්වීම අවශ්‍ය වේ.** මුදල් ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගැනීම සහ මුල්‍ය ක්‍රමය හැසිරවීමේ කටයුතු තවදුරටත් වර්ධනය කිරීම සඳහා උද්ධමනාත්මක පීඩනයන් හඳුනා ගැනීමට සහ එය මැනීමට උපකාරී වන වඩාත් නියෝජනාත්මක උද්ධමන මිනුමක් යොදා ගැනීම, ආර්ථිකයේ ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනාත්මක පීඩනය මැනීමට හැකිවන පරිදි යටිදැරි උද්ධමනය මැනීමේ ක්‍රම වැඩි දියුණු කිරීම, උද්ධමනාත්මක අපේක්ෂාවන් පිළිබඳ සමීක්ෂණ පැවැත්වීම සහ ඉදිරි දක්මක් සහිත දර්ශකයන් වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වේ.

- **මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය මුල්‍ය ක්‍රමයේ කාර්යක්ෂමතාවය සහ ස්ථායීතාවය මත විශාල වශයෙන් රඳා පවතී.** එමනිසා බැංකුවල අතරමැදිකරණ පිරිවැය අඩු කිරීම, ප්‍රාග්ධන අරමුදල් වැඩි කිරීම සහ අවදානම් කළමනාකරණය තවදුරටත් වර්ධනය කිරීම යනාදී ක්‍රියා මාර්ග මගින් මුල්‍ය ක්‍රමයේ කාර්යක්ෂමතාවය සහ ඔරොත්තුදීමේ හැකියාව වැඩි කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග තවදුරටත් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

- **මුදල් කළමනාකරණයේ සාර්ථකත්වය සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය අඛණ්ඩව පවත්වා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි.** රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය නොමැතිවූ විට සම්පත් සඳහා අධික ඉල්ලුමක් ඇතිවී ආර්ථිකයේ ඉල්ලුම් පීඩනය ඉහළ යාමත් ඒ සමග උද්ධමන පීඩනය වැඩිවීමත් සිදුවේ. එයට විසඳුමක් වශයෙන් රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ ණය ගැනීමේ පිරිවැය ඉහළ නැංවීම තුළින් ඉල්ලුම් පීඩනය අඩුකිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම අපේක්ෂා කෙරේ. රජයේ අරමුණ වන්නේ රාජ්‍ය මූල්‍ය ගැලපුම් ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමයි. කෙසේ වුවද, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයේ යම් ප්‍රමාද වීමක් හෝ වෙනස්වීමක් සිදු වුවහොත් එය උද්ධමනය ඉලක්ක කරගත් මුදල් ප්‍රතිපත්තියක් කරා යාමට අහිතකර ලෙස බලපානු ඇත. එබැවින්, මුදල් ප්‍රතිපත්තියෙහි කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කිරීමෙහිලා දැනට පවත්නා උත්සාහයන් තවදුරටත් කඩිනම් කිරීම අවශ්‍ය වේ.